**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වූ රු.19,483,381 ක් සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීම වෙනුවට, රු.18,893,704 කින් හර කිරීම නිසා, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.38,377,085 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.366,500 ක මන්ත්‍රී දීමනා හා වැඩ බැලීමේ දීමනා ප්‍රතිපූර්ණ මුදල් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ලැබීම් හා දෙසැම්බර් 31 දිනට ණයගැතියන්රු.366,500 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය රු.263,077 ක් වුවද, එය රු.121,127 ක් ලෙස දැක්වීම නිසා වත්කම් රු.141,950 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු. 145,000 ක උත්සව අත්තිකාරම්, සේවක ණය ගිණුමට හර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුම හර කිරීම නිසා අත්තිකාරම් ගෙවීම් රු.145,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.913,672 ක් වුවද, එය රු.1,839,248 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වත්කම් රු.925,576 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව අංක 7017020 දරන ජංගම ගිණුමේ ශේෂය රු.366,706 ක් වුවද, එය රු.300,140 ක් ලෙස රු.66,566 ක් අඩුවෙන්ද, අංක 7016915 දරන ජංගම ගිණුමේ රු.94,921 ක් වූ සෘණ ශේෂය රු.89,032 ක සෘණ ශේෂයක් ලෙස දැක්වීම නිසා රු.5,889 කින් සෘණ ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී ගිණුම්ගත කළ තොරතුරුවලට අනුව 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,568,860 ක් වුවද, එය රු.1,241,739 ක් ලෙස රු.1,327,121 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේ වුවද, 2014 වර්ෂය තුල ලැබුණු ආදායම් උපලේඛණ හා අයවැයගත මුද්දර ගාස්තු ආදායම සමඟ සැසඳීමේ දී වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම අධි ගණනයක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) ගිණුම්ගත කර තිබුණු තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ උසාවි දඩ ආදායම රු.1,541,010 ක් වුවද, එය රු.328,045 ක් ලෙස රු.1,212,965 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේ වුවද, වර්ෂය තුල ලැබී තිබුණු උපලේඛණ අනුව උසාවි දඩ ආදායම රු.1,003,657 ක්ද, 2014 අයවැය ඇස්තමේන්තුව අනුව රු.500,000 ක් ද, වුවත් වර්ෂයේ ගිණුම්ගත කරන ලද ආදායම රු.2,213,433 ක් බැවින් ආදායම් අධිගණයක් නිරීක්ෂණය විය.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**
--------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයක් අදාල උපයෝගී ලේඛණ සමඟ සැසඳීමේ දී රු.9,881,285 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **අවිනිශ්චිත ගිණුම්**
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.45,711,101 ක බැර ශේෂයක් පැවතුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 30,685,145 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.4,735,961 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,474,176 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රජාපාදක සංවිධානවලට ද්‍රව්‍යාධාර ලබාදීම සඳහා අවස්ථා 88 කදී රු.901,750 ක මුදලක් වැයකර තිබුණි. |
| (ආ) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත | පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 16 ක් වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මු.රෙ. 371 | 2014 වර්ෂයේ අවස්ථා 04 කදී ගෙවන ලද රු.413,673 ක් වූ අත්තිකාරම් 2015 අගෝස්තු වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මු.රෙ. 396(ඇ) | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල රු.13,427 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.914,202 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.423,494 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,337,696 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**
--------------------

2.2.1 **බදු කුලී**
--------

සභාවට අයත් මාර්ල තලන යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.32,400 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
----------------------------

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.328,045 ක් හා මුද්දර ගාස්තු රු1,241,739 ක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
--------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
----------------------------

(අ) දොරින් දොරට ගමන් ගමට වැඩසටහන යටතේ 2014 වර්ෂයේ ගිවිසුම්ගත වූ ගිවිසුම් මුදල රු.2,448,674 ක් වූ කර්මාන්ත 05 ක් 2015 අගෝස්තු වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 22 ක් සඳහා කඩ කුලී තක්සේරුකර තිබුණද, නව තක්සේරු කුලිය අය නොකර පැරණි කුලියම අයකර තිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

--------------------

(අ) 2002 වර්ෂයේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ රු.533,100 ක් වැයකර ඩොලමයිට් ව්‍යාපෘතියක් සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල එම ව්‍යාපෘතිය ආරම්භ නොකර අතහැර දැමීම නිසා 2003 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) යුධ හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා ගෙන ගොස් 2010 ඔක්තෝබර් 27 දින නැවත සභාවට භාර දෙන ලද අංක: 53-5073 දරන කැබ් රථය ධාවනයට නුසුදුසු අබලන් තත්ත්වයෙන් සහා භූමියේ ගාල්කර තිබුණි.

(ඇ) අංක 78-6932 අත්ට්‍රැක්ටරය භාවිතා කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

3.3 සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන අතර සභා බල ප්‍රදේශය තුලින් රැස්කරනු ලබන කැලිකසල බදුල්ල පාර 13 සැතපුම් කණුව අසල ඉඩමකට අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුනි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය